# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2023/37 – 2017 ජූනි 14 වැනි බදාදා – 2017.06.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2017 අංක 125 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/9/2015/ඩබ්ලිව්එස්/73.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය:
ඩී/ඩීඑස්/එල්බී/2013/47.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2017 මැයි මස 31 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර''
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.**– ප්‍රාදේශීය ලේකම්, ඩෙල්ෆ්ට්.

2. **ඉඩමේ විස්තරය.**– උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, ඩෙල්ෆ්ට් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක ජේ/04, ඩෙල්ෆ්ට් මධ්‍යම, ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පෙරුක්කොඩි ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක වයිඡ්/ඩීඑල්එෆ්/2016/21 හා 2016.02.16 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' ලෙස දක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0620ක් පමණ වන සින්නවත්තම්පු නමැති ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – සින්නවන්තම්පු – ප්‍රමාණය: හෙක්. 0.0620ක් පමණ**

උතුරට: මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ කුමාරවේළු ධර්මලිංගම් හා තවත් අය හිමිකම් කියන සින්නවන්තම්පු ඉඩම; නැගෙනහිරට: කුමාරවේළු ධර්මලිංගම් හා තවත් අය සහ තෝමස් ඇන්ටනි දස් හා තවත් අය හිමිකම් කියන සින්නවන්තම්පු ඉඩම; දකුණට: තෝමස් ඇන්ටනි දස් හා තවත් අය හිමිකම් කියන සින්නවන්තම්පු ඉඩම සහ පාර; බටහිරට: පාර සහ මාර්ගය (ප්‍රාදේශීය සභා).

06 - 1034

1A – G025718– 32 (2017/06)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.